**ක්‍රිකට් ඒඩ් (ඇපකාර) සමාගම - 2020**
**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. මතය ව්‍යාචනය**

ක්‍රිකට් ඒඩ් (ඇපකාර) සමාගමේ ("සමාගම") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි සපයා ගැනීමට මා හට නොහැකි විය.

**1.2. මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4. විගණන විෂය පථය**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ**

**1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | වටිනාකම රු. | සාක්ෂි නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) නිදන්ගත වකුගඩු රෝග සඳහා අරමුදල් රැස්කිරීමේ වැඩසටහන මඟින් එකතු කරන ලද මුළු අරමුදල් | 3,925,000 | මුද්‍රණය කරන ලද සහ අලෙවිකළ ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව පිළිබඳ විස්තර, ප්‍රවේශ පත්‍රවල මිල, වැඩසටහනේ පිරිවැය හා වැඩසටහනේ අපේක්ෂිත ආදායම, වැඩසටහනේ කාලසීමාව, සිද්ධි කළමනාකරණ සමාගම තෝරාගැනීමේ ක්‍රියා පටිපාටිය හා ඔවුන්ගේ කාර්යභාරය,සිද්ධි කළමනාකරණ සමාගම සඳහා ගෙවීම සහ වෙන්දේසියේ තබා ඇති අයිතම පිළිබඳ විස්තර | කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි විය. | වැඩසටහන සඳහා එකතු කරන ලද මුළු අරමුදල සහ මුළු වියදම සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ප්‍රමාණවත් ලේඛන සැපයිය යුතුය. |
| (ආ) වැඩසටහන සඳහා දරන ලද මුළු වියදම | 12,443,706 | | | |

**1.5.2 සමාගමේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 28 දින ශ්‍රී ලංකා ක්‍රිකට් විධායක කමිටුව විසින් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන ක්‍රිකට් ඒඩ් (ඇපකාර) සමාගමේ ක්‍රියාකාරිත්වය අත්හිටුවීමට අනුමැතිය ලබා දී තිබුණි. එම තීරණය ගන්නා විට සමාගම සතුව තිබූ මුළු වත්කම් රු.5,014,680 ක් සහ මුළු වගකීම් රු. 710,689 ක් විය.<br>මුළු වගකීම් 2022 දෙසැම්බර් 30 වන දින පියවා තිබුණි. ක්‍රියාකාරිත්වය අත්හිටුවීමට අනුමැතිය ලබා දීමෙන් පසු ඇතිවූ රු. 248,000 ක වගකීම් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2023 අගෝස්තු 01 දින නිරවුල් කර තිබුණි. 2022 මාර්තු 31 දිනට පැවති රු. 4,389,850 ක බැංකු ශේෂයෙන් රු.4,300,000 ක් 2022 වර්ෂය අවසානයේදී හා ඉතිරි රු.89,850 ක බැංකු ශේෂය 2023 ජනවාරි 24 දින ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ බැංකු ගිණුමට පවරා තිබුණි. එමෙන්ම, ක්‍රිකට් ඒඩ් (ඇපකාර) සමාගමේ මෙහෙයුම් නවතා වසර දෙකකට වැඩි කාලයක් ගතවී ඇතත්, ඈවර කිරීමේ ක්‍රියාවලිය මේ දක්වා අවසන් කර නොතිබුණි. | නිරීක්ෂණයේ සඳහන් දිනවලදී ගනුදෙනු සිදුකර ඇති බව පිළිගෙන ඇත. සමාගමේ මෙහෙයුම් වසර දෙකකට පෙර නතර කළද, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලා සිටි 2021 වර්ෂය දක්වා විගණිත මූල්‍ය ප්‍රකාශන නොමැතිවීම හේතුවෙන් ඈවර කිරීමට හැකියාවක් නොමැත. | ඈවර කිරීමේ ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 248,500 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,496,213ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,744,713 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යංශය විසින් ලබාදුන් නිර්දේශ අනුව 2020 ජනවාරි 28 දින ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටුව විසින් සමාගමේ මෙහෙයුම් කටයුතු අත්හිටුවීමට ගත් තීරණය මත සමාලෝචිත වර්ෂය තුළ ආදායම් රැස්නොකිරීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන හේතුව වී තිබුණි.